## දෙවැනි සෞඛ්‍ය අංශ සංවර්ධන ව්‍යාපෘතියේ - II සංරචකය - 2017

---

දෙවැනි සෞඛ්‍ය අංශ සංවර්ධන ව්‍යාපෘතියේ - II සංරචකය 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2013 අගෝස්තු 19 දින එළඹි අංක 5228 - එල්කේ දරන මූල්‍ය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

### 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

මූල්‍ය ගිවිසුම අනුව, එවකට සෞඛ්‍ය අමාත්‍යාංශය, වර්තමානයේ සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් ජාතික මට්ටමින් ව්‍යාපෘතියේ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන අතර පළාත් මට්ටමින් ව්‍යාපෘතියේ කාර්යයන් පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් සිදු කිරීමට අපේක්ෂා කරනු ලැබේ. ව්‍යාපෘති ඇගයීම් ලියවිල්ලට අනුව, 2013 සිට 2017 වර්ෂය දක්වා ජාතික සෞඛ්‍ය සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීමට මූල්‍ය සහාය සැපයීම සඳහා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ. මන්ද පෝෂණය හා බෝ නොවන රෝග පිළිබඳ අභියෝග සඳහා වඩා යහපත් ප්‍රතිචාර ඇති කිරීම සඳහා හැකිවනු පිණිස මහජන සෞඛ්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රමිතීන් ඉහළ නැංවීම ව්‍යාපෘතියේ අරමුණ වේ. මූල්‍ය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 25,270 කට සමාන විගැහි මිලියන 129.8 ක් (එජඩො මිලියන 200 ක්) වන අතර ඉන් රු.මිලියන 1,263.5 කට සමාන විගැහි මිලියන 6.5 ක් (එජඩො මිලියන 10 ක්) ව්‍යාපෘතියේ II - සංරචකය යටතේ සිදු කළ යුතු කාර්යයන් සඳහා වෙන්කර තිබුණි. ව්‍යාපෘතිය එහි කාර්යයන් 2013 ජුලි 01 දින ආරම්භ කරන ලද අතර 2018 සැප්තැම්බර් 30 වන විට නිම කිරීමට නියමිතය. මෙම වාර්තාව සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් ජාතික මට්ටමින් සිදු කරන ලද කාර්යයන් හා වෙනම ඉදිරිපත් කරන ලද ව්‍යාපෘතියේ II - සංරචකය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම් වලින් සමන්විත වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා

ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනාගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය, එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඌ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(ඒ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 මතය

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2016 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය, එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව.

(ඈ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථකිරීම සඳහා ඉදිරිපත් කර ඇති වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව.

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඊ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

---------------------------------------

#### 2.2.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

---------------------------------------------

ශික්ෂණ රෝහල්වල අධ්‍යක්ෂවරුන් සඳහා ව්‍යාපෘතිය විසින් ලබා දෙන ලද එකතුව රු.මිලියන 6.33 ක් වූ අත්තිකාරම් 2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව දින 16 සිට දින 348 දක්වා කාල පරාසයක් නිරවුල් නොකර පැවතුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

----------------------------------

### 3.1 අරමුදල් උපයෝජනය

----------------------------

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ සහ 2017 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පහත දැක්වේ.

| ප්‍රභවය | මූල්‍ය ගිවිසුමට අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2017 දෙසැම්බර් 31 දිනට | |
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ජාසංසං සංරචකය - II | 10 | 1,263.50 | 530.0 | 3.01 | 460.76 | 5.33 | 817.22 |
| එකතුව | 10 | 1,263.50 | 530.0 | 3.01 | 460.76 | 5.33 | 817.22 |

ඉහත තොරතුරු අනුව, ව්‍යාපෘතිය යටතේ වෙන්කරන ලද රු.මිලියන 1,263.50 කට සමාන එජඩො මිලියන 10 ක්වූ මුළු වෙන්කිරීමෙන් සියයට 64.68 ක් නියෝජනය වන රු.මිලියන 817.22 කට සමාන එජඩො මිලියන 5.33 ක මුදලක් පමණක් 2017 දෙසැම්බර් 31 දිනට වර්ෂ 04 ක් ඉකුත්වීමෙන් පසුව උපයෝජනය කර තිබුණි. එබැවින්, ව්‍යාපෘතියේ ඉතිරි වර්ෂ 01 ක කාල පරිච්ඡේදය තුළ සම්පූර්ණ වෙන්කිරීම උපයෝජනය කිරීමේ හැකියාව සැක සහිතය.

**3.2 භෞතික ප්‍රගතිය**

ව්‍යාපෘතියේ කාර්යයන් නවෝත්පාදන, ප්‍රතිඵල නියාමනය හා ධාරිතා වර්ධනය නම් වූ උප සංරචක 03 කින් සමන්විත විය. ඉලක්ක ඉටුකරගැනීම පිළිබඳ නිරීක්ෂණයන් පහත විස්තර කරනු ලැබේ.

(අ) සෞඛ්‍ය අංශයේ විශේෂඥයන්ගෙන් නවෝත්පාදන අදහස් 69 ක් සඳහා යෝජනා ව්‍යාපෘතියට ලැබී තිබූ බව නිරීක්ෂණය වූ අතර ඉන් 2017 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 399.31 ක පිරිවැයකට සිදු කිරීම සඳහා වූ යෝජනා 34 ක් මත පර්යේෂණ කාර්යයන් පිළිගෙන තිබුණි. තවද ඇස්තමේන්තුගත පිරිවැයෙන් සියයට 40 ක් නියෝජනය වන රු.මිලියන 158.94 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ව්‍යාපෘතිය විසින් ඒ සඳහා මුදා හැර තිබුණි. පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ආරම්භ කරන ලද පර්යේෂණ 34 ක කාර්යයන්ගෙන් යෝජනා 03 ක් යටතේ පර්යේෂණ සම්පූර්ණ කර සමාලෝචිත වර්ෂය අවසානයට අවසාන වාර්තා භාර දී තිබුණි. එබැවින්, ව්‍යාපෘතියේ ඉතිරි වර්ෂ 01 ක කාලපරිච්ඡේදය තුළ සම්පූර්ණ පර්යේෂණ කාර්යයන් නිමකිරීමේ හැකියාව සැකසහිතව පැවතුණි.

(ii) පර්යේෂණ සමාලෝචන කමිටුව විසින් පර්යේෂණ කාර්යයන් නිරන්තරයෙන් නියාමනය කිරීම අවශ්‍ය වුවද, පර්යේෂණ සමාලෝචන කමිටුවේ සාමාජිකයෙකු ලෙස පත්කරන ලද විශේෂඥයකු පර්යේෂණ 03 ක් සිදු කිරීම සඳහා භාරගෙන තිබුණි. ඊට අමතරව, පර්යේෂණ 2 ක් වෙනත් වෛද්‍ය නිලධාරියකු විසින් එයට සමගාමීව භාරගෙන තිබූ අතර, කිසිඳු පර්යේෂණයක් සම්පූර්ණ කර නොතිබුණි.

(ආ) ධාරිතා වර්ධනය සඳහා දේශීය පුහුණු හා විදේශීය පුහුණු වෙනුවෙන් සංයුක්ත සැලැස්මේ රු.මිලියන 672.74 ක වෙන්කිරීමක් කර තිබූ බවත් මුළු වෙන්කිරීමෙන් සියයට 62 ක් නියෝජනය වන රු.මිලියන 418.95 ක මුදලක් 2017 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කර තිබූ බවත් නිරීක්ෂණය විය. එබැවින්, ව්‍යාපෘතියේ ඉතිරි වර්ෂ 01 ක කාල පරිච්ඡේදය තුළ සමස්ත ධාරිතා වර්ධන වැඩසටහන් සම්පූර්ණ කිරීමේ හැකියාව සැකසහිතව පවතී. පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ධාරිතා වර්ධන වැඩසටහන යටතේ යොමුගත කොන්දේසි අනුව, ලංසු ලියකියවිලි පිළියෙල කිරීම හා ලංසු ඇගයීම පිළිබඳ සෞඛ්‍ය රාජ්‍ය අංශයේ නිලධාරීන් 1,080 ක් සඳහා ව්‍යාපෘති කාලපරිච්ඡේදය තුළ පුහුණු වැඩසටහන් පැවැත්වීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද, අදාළ පුහුණු පාඨමාලාව 2017 දෙසැම්බර් 31 දිනට නිලධාරීන් 86 ක් සඳහා පමණක් පවත්වා තිබුණි.

(ii) ධාරිතා වර්ධන වැඩසටහනට අනුව සෞඛ්‍ය රාජ්‍ය අංශයේ නිලධාරීන් 2100 ක් සඳහා සැලසුම් කරන ලද පරිගණක මාර්ගගත ක්‍රමය (online) මඟින් කෙටි පාඨමාලා වැඩසටහන් 2017 දෙසැම්බර් 31 දක්වා පවත්වා නොතිබුණි.

**3.3 මූල්‍ය පාලන පිළිබඳ ගැටලු**

**--------------------------**

මුදල් රෙගුලාසි 133 (2) හා 2010 ජුනි 26 දිනැති අංක 05 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය අනුව, ව්‍යාපෘතියේ කාර්යයන් පිළිබඳ විගණන සැලැස්මක් රේඛීය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය විසින් පිළියෙල කර ක්‍රියාත්මක කළ යුතුය. කෙසේ වුවද, එවැනි අභ්‍යන්තර විගණන සැලැස්මක් වෙනම පිළියෙල කර සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කර ඇති බවට කිසිදු සාක්ෂියක් විගණනය වෙත ලැබී නොතිබුණි. 2017 අගෝස්තු 14 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව ව්‍යාපෘතිය විසින් අභ්‍යන්තර විගණකවරයකු පත්කර තිබුණද, 2017 දෙසැම්බර් 01 දින ඔහුගේ සේවයෙන් ඉවත්වීම දක්වා සිදුකරන ලද අභ්‍යන්තර විගණන කාර්යයන් පිළිබඳ කිසිදු සාක්ෂියක් ලැබී නොතිබුණි.